සියළු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Department of Education, Southern Province**

දෙවන වාර පරීක්ෂණය 2021
**Second Term Test**

11 ශ්‍රේණිය
**Grade 11**

# බුද්ධ ධර්මය - I

පැය එකයි
**One Hour**

- සියළුම ප්‍රශ්න පිලිතුරු සපයන්න
- 01 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙකුත් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

---

1. බුද්ධත්වය අවබෝධකරගත් බෝසතාණන් වහන්සේ මුහුණ දුන් බරපතලම අභියෝගය වූයේ
   i. දස මාර සේනාව පරාජය කිරීම
   ii. බෝධි වෘක්ෂය දෙස සතියක් පුරා ඇසිපිය නොහෙළා බලා සිටීම
   iii. කෙලෙස් මලින් පිරුණු පෘථග්ජන ලෝකයාට ගැඹුරු දහම අවබෝධ කරවීම
   iv. උපත සඳහා සුදුසු කරුණු විමසා බැලීම

2. ධර්මධර හා විනය ධර භික්ෂූන්වහන්සේලා අතර කලහකාරී හැසිරීමක් සඳහා හේතු වූයේ
   i. නාන තටාකය පිරිසිදු කිරීමට කිසිවෙක් ඉදිරිපත් නොවීම
   ii. උදය බමුණා ප්‍රත්‍ය පහසුකම් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම.
   iii. බුදු සසුනේ තනතුරු ප්‍රධානය කළ ආකාරය පිළිබඳව තිබූ චෝදනා
   iv. වැසිකිළි පරිහරණයේදී බඳුනේ ජලය ස්වල්පයක් ඉතිරි කිරීම

3. "අක්කෝධේන ජිනේ කෝධං" යන ගාථාව පරිදි ක්‍රෝධ කරන්නා දිනාගැනීමට නම්
   I.ක්‍රෝධ කළ යුතුය ii.වෛර කළ යුතුය iii.මෛත්‍රී කළ යුතුය iv.සත්‍ය ප්‍රකාශ කළ යුතුය

4. බුදුන්වහන්සේ කලන්දක නිවාප නම් ස්ථානයට වැඩම කොට සුවදුක් විමසා ධර්මය දේශනා කිරීමෙන් සුවපත් බව ලැබුවේ
   i.මුගලන් මහතෙරුන් වහන්සේ ය ii.මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය
   iii.සැරියුත් මහ රහතන් වහන්සේ ය iv.පූතිගත්ත තිස්ස හිමියන් ය

5. සුනීත, සෝපාක, ආලවක කුමරු, දීඝායු කුමරු, රජ්ජුමාලා යන අයට පිහිට වීම තුළින් පෙන්නුම් කරන බුදුරජාණන් වහන්සේ තුළ පැවති ගුණය වන්නේ
   i.පුරිස දම්ම සාරථී ගුණය ii.අසරණ සරණ ගුණය iii.තාදී ගුණය iv.ගිලානෝපස්ථාන ගුණය

6. "මෙසේ බුදුහු දෙව්රම්වෙහෙර දහම් අමා වහරේ වස් වසමින් ......." යනාදී ඡේදය දුටු විට සිහියට නැගෙන ධර්ම ග්‍රන්ථය වන්නේ
   i.බුත්සරණ ය ii.අමාවතුර ය
   iii.පන්සියපනස් ජාතක පොත් වහන්සේ ය iv.කව්සිළුමිණ ය

7. පාරමිතා ධර්ම පුහුණු කරන්නෙක් අත් හළ යුතු කරුණු 3 කි. ඊට අයත් නොවන්නේ
   i. තණ්හාවෙන් තොරව දාන සීල ආදී ගුණ ධර්ම පිරීම ii. මානයෙන් තොරව එම ගුණධර්ම පිරීම
   iii.මිත්‍යා දෘෂ්ටියෙන් තොරව එම ගුණධර්ම පිරීම iv. කරුණාවෙන් යුක්තව දාන සීල ආදී ගුණධර්ම පිරීම

8. ලෝම හංස ජාතකය හා මහා කපි ජාතක කතාව තුළින් බෝසතාණෝ සම්පූර්ණ කළ පාරමිතා දෙක වන්නේ
   i. දාන පාරමිතාව, ශීල පාරමිතාව
   ii. උපේක්ඛා පාරමිතාව,ක්ෂාන්ති පාරමිතාව
   iii. උපේක්ඛා පාරමිතාව ,මෙත්තා පාරමිතාව
   iv. ප්‍රඥා පාරමිතාව,වීර්යය පාරමිතාව

9. බුදු දහමෙහි කුසල ධර්ම දියුණු කරන මානසික අභ්‍යාසය හඳුන්වන්නේ
i. චෛතසික යනුවෙනි ii.භාවනා යනුවෙනි iii.සතිය යනුවෙනි iv.යෝග යනුවෙනි

10. සිතෙහි පවතින නොසන්සුන් බව,විසුරුණු ගතිය, සෙලවෙන ගතිය
i.උද්ධච්ච නම් වේ ii.කුක්කුච්ච නම් වේ iii.ව්‍යාපාද නම් වේ iv.ථිනමිද්ද නම් වේ

11. සමථ භාවනාව සඳහා යොදා ගත හැකි කර්මස්ථානයකයට අයත් නොවන්නේ
i.දස කසින ii.දස අසුභ iii.දස අනුස්සති iv.දස බල

12. බ්‍රිතානය පාලන සමයේ ක්‍රිස්තු භක්තිකයන් හා දින තුනක් තිස්සේ වාද කොට ඔවුන්ගේ තර්ක බිඳහෙළා පරාජයට පත් කළ වාදිභසිංහ නමින් ප්‍රකට වූ හිමිපාණන් වහන්සේ වන්නේ
   i. වාරියපොළ ශ්‍රී සුමංගල හිමිපාණෝ ය
   ii. සිරි දේවමිත්ත ධර්මපාල හිමිපාණෝ ය
   iii. මිගෙට්ටුවත්තේ ශ්‍රී ගුණානන්ද හිමිපාණෝ ය
   iv. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝ ය

13. බෞද්ධයාගේ අත්පොත නමින් හඳුන්වන ධම්ම පදයේ ඇති වග්ග, ගාථා හා නිදන කථා ගණන පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න
i.423,26,299 ii.299,423,26 iii.26,423,299 iv.423,299,26

14. ශික්ෂාවක් ද, සප්ත ආර්යය ධනයක් ද, දස පින් කිරියවතක් ද, දස රාජ ධර්මයක් ද, පාරමිතාවක් ද. සියළු සුවඳ ඉක්මවා යන සුවඳක්ද වන බෞද්ධ ශික්ෂණ මාර්ගයේ පළමුවැන්න නම්
i.සීලය ii.සමාධිය iii.ප්‍රඥාව iv.දානය

15. “කාලා රස මසු බොජන කර පෙම්....” මෙම කවියේ අවසන් පද පේලිය වන්නේ
   i. ලාලා අබරණ නිසි ලෙස සැරසුම්
   ii. පාලා ගිය වැනි බහු රූ කෝළම්
   iii. ගාලා සුවදැති සඳුණුත් මනරම්
   iv. දාලා ගිය වැනි සසරේ මනු දම්

16. “සුජීවං අහිරිකේන...” යනාදී ධම්ම පද ගාථාව අනුව ජීවත් වීමට පහසු තැනැත්තාගේ ලක්ෂණයක් නොවන්නේ
i.කවුඩෙක් මෙන් ගසා කෑමට හුරු වීම ii.පවට ලැජ්ජා නැති වීම
iii.අණුන්ගේ ගුණ කීම iv.කිලිටි දිවි පැවතුම් ඇති බව

17. බුදු දහම පෙන්වා දී ඇති ධාර්මික රැකියාවක් ලෙස ගත නොහැක්කේ
i.වෙළෙඳාම ii.ගවයන් රැක බලා ගැනීම iii.රාජ්‍ය සේවය iv.වස විස වෙළෙඳාම

18.නිවන් මග අහුරා ඇති ප්‍රහීණ කළ යුතු ධර්ම කරුණු වන්නේ
i.පංච අභිඥාය ii.පංච නීවරණය iii.පංචස්කන්ධයන් ය iv.පංච බලයන් ය

19.“සම වායෝ එව සාධූ” මෙහි සරළ අර්ථය වන්නේ

i.සමගියම යහපත යන්නයි ii.සමගි වන්න විවාද නොකරන්න යන්නයි
iii.අසමගිය යහපතකි යන්නයි iv.සමගියෙන් විවාද කරන්න යන්නයි

20. බුදු දහම හා අන් ආගමිකයන් සියල්ලටම පොදුවේ පිළිගත හැකි ප්‍රතිපත්ති මාලාවක් ලෙස සැලකිය නොහැක්කේ

i.සතර සංග්‍රහ වස්තු ii.සිව්බඹ විහරණ iii.පංච ශීලය iv.දස අකුප වස්තුව

21. “අදත්තාදානය” අයත් වන්නේ
i.කාය කර්මයකටය ii.වචී කර්මයකටය
iii.මනෝ කර්මයකටය iv.කාය හා වචී කර්මයන්ටය

22. පංචානන්තරීය පාපකර්ම හා නියත මිත්‍යා දෘෂ්ටිය අයත් වන්නේ
i.ගරුක කර්ම වලටයි ii.ආසන්න කර්ම වලටයි
iii.ආචිණ්ණ කර්ම වලටයි iv.අහෝසි කර්ම වලටය

23. ගති සම්පත්තිය හා ගැළපෙන පිළිතුර තෝරන්න
i. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් ක්‍රියා කිරීමෙන් මුහුණ දීමට සිදුවන අකුසල කර්ම මගහරවා ගැනීම
ii. සෞභාග්‍යවත් කාලයක උපත ලැබීම නිසා පාපකර්ම වල විපාක නොලැබීම
iii. යස ඉසුරින් පිරි ස්ථානයක උපත ලැබීම නිසා පෙර අකුසල විපාක වැළකී යෑම
iv. උසස් රූප ස්වභාවකට උරුමකම් කීම නිසා වාසනාවන්ත ජීවිතයකට මග පෑදීම

24. පටිච්ච සමුප්පාද යන යෙදුම හා නොගැළපෙන වචනය වන්නේ
i.සහේතුක බව ii.හේතු සහිත බව iii.අහේතුක බව iv.අහේතුක නොවන බව

25. “පටිච්ච සමුප්පාද” න්‍යායට අනුව දිළිඳුකම වැඩි වීමට හේතුව වන්නේ
i.දුප්පත් අයට ධනය නොදීමයි ii.හොරකම වැඩි වීමයි
iii.අවි ආයුධ වැඩි වීමයි iv.ජීවිත හානි වැඩි වීමයි

26. මිනිස් සිත් සතන් තුළ මුල් බැස ඇති රාග,දෝස,මෝහ ආදී කෙලෙස් මුලිනුපුටා දමා ආර්යය භාවයට පත් බුද්ධාදී උතුමන් අවබෝධ කර ගෙන ඇත්තේ
i.චතුරාර්ය සත්‍යයයි ii.දස කසිනයයි iii.කර්මයයි iv.අකුසල මූලයයි

27. අසාර බව, අතෘප්තිකර බව, තුච්ජ බව, අර්ථ ශූන්‍ය බව යන තේරුම් දෙන බුද්ධ වචනය වන්නේ
i.සැකය යන්නයි ii.දුක්ඛ යන්නයි iii.සුඛය යන්නයි iv.වැලපීම යන්නයි

28. සසර ඇති දුක් තුන් ආකාරය බව ධර්ම ග්‍රන්ථ වල සඳහන් වේ. ඒ අනුව ඉන් එකක් වන විපරිණාම දුක්ඛ යනු
i.සාමාන්‍ය දුකයි ii.වෙනස් වීමේ දුකයි iii.වෙන්වීමේ දුකයි iv.ඇති වීම් නැතිවීම් මත දුකයි

29. බුදු දහමට අනුව තණ්හාව හා එය මුල්කොටගත් කෙළෙස් ඇති තැන රජ කරන්නේ
i.විද්‍යාවයි ii.අවිද්‍යාවයි iii.ප්‍රඥාවයි iv.සීලයයි

30. අප අවට ඇති වටපිටාව පරිසරයයි. එහි කොටස් දෙකකි. ඒ අනුව ජීවී පරිසරයට අයත් නොවන්නේ
i.මිනිසා ii.මැරුණු තුරුලතා iii.නොමැරුණු සතුන් iv.පියාඹන සමනල්ලු

31. සිදුහත් බෝසතාණෝ බුදු බව ලැබීමට පෙර දින දිවා විහරණය ගත කළ සොඳුරු පරිසර පද්ධතිය වූයේ

i.නේරංජනා නදී තීරයයි ii.උරුවෙල් දනව්වයි iii.සීත වනයයි iv.භද්‍රවනයයි

32. බෝසතාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණයෙන් අනතුරුව වනගතව අරිය පරියේෂණයෙහි යෙදුණු කාලය වන්නේ

i.වසර 10කි ii.වසර 8කි iii.වසර 6කි iv.වසර 7කි

33. බුදු රජාණන් වහන්සේ කෙත් යායක දී දේශනා කළ සූත්‍රය වන්නේ

i.සාමඤ්ඤඵල ii.සෝණදණ්ඩ සූත්‍රය iii.කසීභාරද්වාජ සූත්‍රය iv.සිංසපා සූත්‍රය

34. බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරට වැඩමකොට මහත් ශබ්ද නගමින් උස් හඬින් කතා කළ භික්ෂූන් අමතා "කොවුලන් සේ ඝෝෂා නොකොට ආරාමයෙන් පිටව යන ලෙස" ප්‍රකාශ කිරීමෙන් ප්‍රකට කළේ

i. වායු දූෂණය නොකිරීමේ වැදගත් කමයි
ii. ශබ්ද දූෂණය නොකිරීමේ වැදගත් කමයි
iii. ජල දූෂණය නොකිරීමේ වැදගත් කමයි
iv. තාප දූෂණය නොකිරීමේ වැදගත් කමයි

35. අවේලාවේ ආහාර නොගන්නා භික්ෂූන් ගිලන්වීම වලක්වාලීමට කැප සරුප් පාන වර්ග වැළඳිය හැකිය. ඒවා දහමේ හඳුන්වන්නේ,

i.ගිලන්පස යනුවෙනි ii.ගිලන් රථ යනුවෙනි iii.ගිලන් හළ යනුවෙනි iv.ගිලන් වත යනුවෙනි

36. ථේරවාදී බුදු දහම පළමුවරට පුස්කොළ පොත් වල ලියවුණේ

i. පළමු ධර්ම සංගායනාවේ දී ය ii. දෙවන ධර්ම සංගායනාවේ දී ය
iii. සිව්වන ධර්ම සංගායනාවේ දී ය iv.කණිෂ්ක ධර්ම සංගායනාවේ දී ය

37. ලක්දිව බුදු දහම ස්ථාපිත වීමත් සමග ගොඩනැගුණු මුල්ම ස්තූපය වන ථූපාරාමයේ තැන්පත් කොට ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ

i.දකුණු අකු ධාතූන් වහන්සේ ය ii.වම් දළදා වහන්සේය
iii.පාත්‍රා ධාතූන් වහන්සේ ය iv.පටි ධාතූන් වහන්සේ ය

38. 'තුන් මහල් පේසාව' නම් කලාත්මක අංගය ඇති බෞද්ධ කලා නිර්මාණය වන්නේ

i.සඳකඩ පහණ ii.ස්තූපය iii.වටදාගෙය iv.වාහල්කඩ

39. "හඟිම් ද මා මෙනෙන් - ගුණ හිමියා කියන්නට
පොහොනෙම් නෙළුඹ සිනැවුනා - පල දුත්හොත් තුසර හර.." යන කවිය අනුව බුදු ගුණ වැනීමේ දුෂ්කරතාව පෙන්වා දී ඇති පද්‍යා පන්තිය ඇත්තේ

i.සසදාවතේය ii.මුවදෙව්දාවතේය iii.පූජාවලියේය iv.අමාවතුරේය

40. බොහෝ ධනය ආහාර පාන තිබිය දීත් ඒවා හුදෙකලාව භුක්ති විඳීම

i.මංගල කරුණකි ii.පරාභව කරුණකි iii.දියුණුවේ දොරටුවකි iv.සප්ත ආර්යය ධනයකි

සියළු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## දෙවන වාර පරීක්ෂණය 2021
## Second Term Test

| 11 ශ්‍රේණිය<br>Grade 11 | බුද්ධ ධර්මය - II | පැය දෙකයි<br>Two Hours |
|---|---|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද 2-6 දක්වා ප්‍රශ්න වල I කොටසට ලකුණු 02ක් ද II කොටසට ලකුණු 03ක් ද III කොටසට ලකුණු 05ක් ද හිමි වේ. 7 වන ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 05 කි.
- ප්‍රශ්න පත්‍රය කියවීම සඳහා අමතර මිනිත්තු 10ක කාලයක් දෙනු ලැබේ.

---

1.

i. බුදු සසුනේ අගසව් දෙනම නම් කරන්න
ii. සිදුහත් බෝසතාණෝ දුටු සතර පෙර නිමිති මොනවා ද ?
iii. "නිබද්ධ චාරිකා" හඳුන්වන්න
iv. "ලාභෝ අලාභෝ අයසෝ යසෝච".... මෙහි දැක්වෙන ධර්ම කරුණු හැඳින්වෙන්නේ කෙසේද?
v. තුන්තරා බෝධිය නම් කරන්න
vi. "යේ ධම්මා හේතුප්පභවා" .....ගාථාව සම්පූර්ණ කරන්න
vii. බුද්ධ කාලීන භාරතයේ පැවති විමුක්ති මාර්ග දෙක නම් කරන්න.
viii. බුද්ධ වචනය අනුව රෝග දෙයාකාරය එම දෙයාකාරය නම් කරන්න.
ix. සිංහලෙන් රචනා වූ පැරණිම ගී කාව්‍ය දෙක නම් කරන්න.(පොළොන්නරුව යුගයට අයත්)
x. නිවන් මගට පිවිසීමේ පළමු පියවර කුමක් ද?

2.

i. බුදු සිරිතේ දැක්වෙන තාදී ගුණය හඳුන්වන්න
ii. ඉහත සඳහන් ගුණයට බුදු සිරිත ඇසුරින් උදාහරණ 03ක් ලියන්න
iii. සිසු ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා ඉහත ගුණය උපකාර කරගන්නා ආකාරය විස්තර කරන්න

3.

i. යම් ක්‍රියාවක් කිරීමෙන් පසුතැවෙන්නට සිදු වේ ද.... යන අදහස දැක්වෙන ධම්මපද ගාථාව ලියන්න
ii. ඉහත ගාථාවේ තේරුම ලියන්න
iii. ධම්ම පදය උපදේශනාත්මක ග්‍රන්ථයක් වශයෙන් වැදගත් වන්නේ ඇයි දැයි විස්තර කරන්න

4.

i. පාරමිතා ධර්ම හඳුන්වන්න
ii. බුදු,පසේ බුදු, මහරහත්, යන තත්වයන්ට පත්වීමට වැඩිය යුතු පාරමිතා පිළිවෙළින් නම් කරන්න.
iii. සිසු ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා වීර්යය පාරමිතාව අදාළ කරගන්නා ආකාරය විස්තර කරන්න.

5.

i. පළමු, දෙවන ධර්ම සංගායනා පැවැත් වූ ස්ථාන දෙක පිළිවෙළින් නම් කරන්න.
ii. පළමු, දෙවන,තෙවන ධර්ම සංගායනා සඳහා අනුග්‍රහය දැක් වූ පාලකයන් නම් කරන්න.
iii. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල විස්තර කරන්න.

6.

i. බුදු දහමේ දැක්වෙන භාවනාවේ ප්‍රභේද දෙක කුමක් ද?
ii. භාවනා වැඩීමේදී පුද්ගල චරිතය පිළිබඳව සොයා බැලීමේ වැදගත්කම කුමක් ද?
iii. 'සුගත' බුදු ගුණය අරමුණු කරගෙන භාවනා වඩන ආකාරය විස්තර කරන්න.

7. කොටස් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න

i. රේරුකානේ චන්දවිමල මහ නාහිමි
ii. සීලයේ ආනිසංස
iii. ජනක කර්ම
iv. මුරගල

I - කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1-(Iii) | 2-(iv) | 3-(iii) | 4-(i) | 5-(ii) | 6-(ii) | 7-(iv) | 8-(iii) | 9-(ii) | 10-(i) |
| 11-(iv) | 12-(iii) | 13-(iii) | 14-(i) | 15-(ii) | 16-(iii) | 17-(iv) | 18-(ii) | 19-(i) | 20-(iv) |
| 21-(i) | 22-(i) | 23-(iii) | 24-(iii) | 25-(i) | 26-(i) | 27-(ii) | 28-(ii) | 29-(ii) | 30-(ii) |
| 31-(iv) | 32-(iii) | 33-(iii) | 34-(ii) | 35-(i) | 36-(iii) | 37-(i) | 38-(ii) | 39-(ii) | 40-(ii) |

**II පත්‍රය**

1.

i. සැරියුත් හිමි/මුගලන් හිමි, සාරිපුත්‍ර/ මොග්ගල්ලාන
ii. ලෙඩෙක්,මහල්ලෙක්,මළමිනිසෙක්,පැවිදි රුවක්
iii. බුදු රජාණන් වහන්සේ විසින් විශේෂ පුද්ගලයෙක් හෝ පිරිසක් අරඹයා පිහිට වීමට වැඩම කිරීම.
iv. අෂ්ට ලෝක ධර්මය/අටලෝ දහම
v. බුදු,පසේ බුදු, මහරහත්
vi. යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තතාගතෝ ආහ
තේ සංචයෝ නිරෝධෝ - ඒවං වාදී මහා සමණෝ
vii. කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමථානුයෝගය
viii. කායික රෝග හා මනසික රෝග / කායික රෝග, චෛතසික රෝග
ix. මුවදෙව්දාවත හා සසදාවත
x. ශ්‍රද්ධාව

2.

i. අටලෝ දහමින් කම්පාවට පත්නොවී මධ්‍යස්ථව සියල්ල විඳදරා ගැනීමට ඇති හැකියාව
ii. කොසොල් රජතුමා අසදෘශ මහා දානයෙන් බුදුරදුන් පිදීම
අනේපිඩු විශාඛා වැනි ප්‍රභූවරු වෙහෙර විහාර පූජා කිරීම
දොළොස්වන වස් කාලයේ ‘යව’ නැමැති ආහාරයෙන් යැපීමට සිදු වීම
සුප්පිය පරිබ්‍රාජකයා හා බ්‍රහ්ම දත්ත යන දෙදෙනාගේම පුවත
සෝණදණ්ඩ,පොට්ඨපාද,වංකී වැනි අන්‍යාගමිකයන් බුදුන් වහන්සේ ඇගයීම
මෙවැනි ගැලපෙන අවස්ථා තුනකට ලකුණු දෙන්න
iii. අටලෝ දහම නම් කිරීම
සියළුදෙනා එයට යටත්වන බව
අටලෝ දහම තුළ තමන් සතුටුවන කරුණු 4ක්ද අසතුටු වන කරුණු 4ක්ද ඇති බව දැනගෙන
ඒ ඒ අවස්ථාවලදී අකම්පිතව ක්‍රියා කිරීමේ අගය උදාහරණ සහිතව ලියා ඇති පිළිතුරු වලට
උපරිම ලකුණු දෙන්න.

3.

i. නතං කම්මං කතං සාධු
යංකත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛෝ රෝදං
විපාකං පටිසේවති
ii. යමක් කිරීමෙන් පසු තැවෙන්නට සිදුවේ ද යමක විපාකය කඳුළු පිරි මුහුණින් යුතුව අඬමින් විඳින්නට සිදුවේ ද එබඳු දේ නොකිරීම යහපත්ය.
iii. ‘ධම්මපදය’ නම් ග්‍රන්ථය සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයකි. එහි වග්ග 26ක් ද ගාථා 423 හා නිදාන කථා 299ක් ද අන්තර්ගත ය. මෙය බෞද්ධයාගේ හස්ථ සාර ග්‍රන්ථය හෙවත් බෞද්ධයාගේ අත්පොත වශයෙන් සලකන ඉතාම වටිනා ධර්මෝපදේශ වලින් අනූන ග්‍රන්ථයකි. මෙහි ඇති සෑම ගාථාවකින්ම පුද්ගලයාගේ ජීවිතය සාර්ථක කරගැනීමට අවශ්‍ය සදුපදේශයන් ලබා දෙන බැවින් බාල,තරුණ,මහළු යන කවර තරාතිරමක පුද්ගලයෙකුට පවා තම ජීවිතය ගොඩනගා ගැනීමට මෙහි ඇති ආදර්ශයන් ඉවහල් වේ. ගාථා අවම වශයෙන් තුනක් වත් ගෙන විස්තරාත්මකව පිළිතුරු ලියා ඇත්නම් උපරිම ලකුණු දෙන්න.

4.

i. බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් විසින් පුරනු ලබන ගුණ ධර්ම පාරමිතා නම් වේ. බුද්ධ කාරක ධර්ම යනුවෙන් ද මේවා හඳුන්වයි.

ii. බුදු වීමට - පාරමී හා උප පාරමී හා පරමත්ත පාරමී යන සමතිස් පාරමිතා ද
පසේ බුදු වීමට - පාරමී හා උප පාරමී යන විසි වැදෑරුම් පාරමිතා ද
මහ රහත් වීමට - පාරමී ගුණ ධර්ම දහයද සම්පූර්ණ කළ යුතුය.

iii. පාරමිතාවන් සංඛ්‍යාත්මකව දහයකි. මෙම සෑම පාරමිතාවක්ම තම ජීවිතය සාර්ථක කර ගැනීමට යොදාගත හැකිය. ශිෂ්‍ය ජීවිතය යනු අධ්‍යාපනය හදාරණ අවධියකි. මෙම කාලයේ තම සිසු ජීවිතය සාර්ථක කර ගැනීමට වීර්යය වැඩිය යුතු වේ. 'වීර්යය' යනු උතුම් බලාපොරොත්තුවක් ඉටුවන තුරු නොපසු බට උත්සාහයෙන් කටයුතු කිරීමයි. පසු බැසීමට හේතු වන කුමන කරුණක් හමුවේ වුවද උත්සාහය අත් නොහැර ආරම්භ කළ කාර්යය නොනවත්වා කරගෙන යාමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් ක්‍රියා කළ යුතුය වීර්යයේ අවස්ථාවන් 3ක් ඇත. ආරම්භක ධාතු, නික්කම්ම ධාතු හා පරක්කම ධාතු යනුවෙන් එම අවස්ථා තුන හඳුන්වා දී ඇත.
සිසු ජීවිතය ගොඩනගා ගැනීමට ශිෂ්‍යයන් වශයෙන් සිත එක අරමුණක පිහිටුවාගෙන වීර්යය වඩා ක්‍රියා කිරීමෙන් බොහෝ ජයග්‍රහණ, කුසලතා, සම්මාන, වැඩිහිටි ගෞරව යනාදිය ලබාගත හැකිය. (උචිත පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න)

5.

i. පළමු ධර්ම සංගායනාව - රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහා ද්වාරය අභියස
දෙවන ධර්ම සංගායනාව - විශාලා මහ නුවර වාලුකාරාමය

ii. පළමු සංගායනාව - අජාසත් මහ රජතුමා
දෙවන සංගායනාව - කාලාශෝක රජතුමා
තෙවන සංගායනාව - ධර්මාශෝක රජතුමා

iii. බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 ගත වූ පසු ධර්මාශෝක රජතුමාගේ අනුග්‍රහයෙන් පැලලුප් නුවර අශෝකාරාමයේ දී තුන්වන ධර්ම සංගායනාව පවත්වන ලදී. ශාසන ඉතිහාසයේ ඉතා වැදගත් සංගායනාවක් වන තෙවන ධර්ම සංගායනාව සිදු කළ බැවින් බුදු සසුනේ චිරස්ථිතියට ඉමහත් හේතුවක් වූ ධර්ම සංගායනාවක් වශයෙන් මෙය හැඳින්විය හැකිය. මෙම සංගායනාවේ ප්‍රතිඵල වන්නේ.

* දුසිල් මහණුන් හැට දහසක් සුදුවත් හඳවා සසුනෙන් නෙරපීම
* ශාසන පිළිවෙත් නැවත ආරම්භ කිරීම
* කථාවත්ථුප්‍රකරණය ඇතුළත් කර අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම
* ත්‍රිපිටකය අංග සම්පූර්ණ වීම.
* රටවල් 09කට ධර්ම දූත කණ්ඩායම් පිටත්ව යාම නිසා දේශීයවද විදේශීයද ධර්ම ප්‍රචාරක කටයුතු සිදු වීම. (මෙම කරුණු ආශ්‍රිතව ලියා ඇති පිළිතුරු සඳහා උපරිම ලකුණු දෙන්න.

6.

i. සමථ භාවනාව හා විපස්සනා භාවනාව/ සමාධි භාවනාව, ප්‍රඥා භාවනාව/ චිත්ත භාවනාව, විදර්ශනා භාවනාව හෝ උචිත වෙනත් පිළිතුරු

ii. භාවනාව යනු සිත යහපත් අරමුණකින් වැඩීමයි. භාවනා වඩන විට වඩා වැදගත් වන්නේ පුද්ගලයාගේ සිතයි. පුද්ගලයාගේ සිත අනුව චරිත ලක්ෂණද සැකසී ඇත.මේ අනුව පුද්ගල චරිත වර්ග හයක් බුදු දහම අනුව පෙන්වා දී ඇත. රාග,ද්වේශ,මෝහ,ශ්‍රද්ධා, බුද්ධි හා විතර්ක යනුවෙන් මෙම චරිත හය හඳුන්වයි. මෙම විවිධ වූ චරිත වල ස්වභාවය අනුව උචිත භාවනා ක්‍රමය කුමක්ද යන්න හඳුනාගෙන භාවනාව වැඩිය යුතුය. උදාහරණයක් වශයෙන් රාග චරිත සඳහා අසුභ භාවනාවද, ද්වේශ චරිත සඳහා මෛත්‍රී භාවනාවද වශයෙන් උචිත භාවනාව තෝරාගෙන භාවනා වඩනවිට අවශ්‍ය අරමුණ ඉටු වේ. මේ සඳහා භාවනා උපදෙස් ලබා දෙන කම්මට්ඨානාචාර්ය වරයෙකුගේ සහය ලබා ගැනීම උචිත වේ.

iii. “සුගත” බුදු ගුණය වැඩීම සඳහා බුද්ධ ප්‍රතිමාවක් හෝ බුද්ධ රූපයක් සපයා ගත යුතුය. භාවනාවට පෙර පූර්ව අවශ්‍යතා ඉටුකරගෙන බුද්ධ ප්‍රතිමාව හෝ බුද්ධ රූපය ඉදිරියේ භාවනා ඉරියව්වෙන් වාඩි වී නමස්කාර පාඨය කියවා තෙරුවන් සරණ ගොස් පන්සිල් සමාදන්ව බුදු රුව දෙස හොඳින් බලා සුගත ගුණය මෙනෙහි කොට ඇස් පියාගෙන සිතින් මෙනෙහි කොට සිතින් දැකීමට උත්සාහ කරමින් යලි යලි සුගත ගුණය මෙනෙහි කරන්න. සිතෙහි ඇඳුණු බුදු රුව දෙස සිතමින් සුගත බුදු ගුණයේ අවස්ථා තුන පිළිවෙළින් නැවත නැවත සිහි කොට අධිෂ්ඨානය කළ පසු දෙවියන්ට පින් දී භාවනාව අවසන් කළ යුතුය. (පිළිතුර සළකා බලා ලකුණු දෙන්න.)

7.

i. <u>රේරුකානේ චන්ද විමල මහ නා හිමි</u>

රයිගම් කෝරළයේ රේරුකාන ගමෙහි උපත ලද රුබෙල් ගුණවර්ධන දරුවා පැවිදි වූ පසු රේරුකානේ චන්ද විමල නම් විය. බුරුම රටට වැඩමකොට ත්‍රිපිටකය හා බුරුම භාෂාවත් මනාව ඉගෙනගෙන එහි දීම උපසම්පදාව ලබා පසු කාලයක දී ලංකාවට වැඩම කළේය. ඉතා චාම් අල්පේච්ඡ දිවි පෙවෙතක් ගත කළ උන් වහන්සේ නිහතමානී යතිවරයෙකි. බෞද්ධයාගේ දැනුම වර්ධනයට ග්‍රන්ථ රාශියක් උන්වහන්සේ රචනා කළහ. පාරමිතා ප්‍රකරණය, පොහොය දිනය, ධර්ම විනිශ්චය ඉන් කිහිපයකි. 1997 ජූලි 4 දින අපවත් වූ උන්වහන්සේගේ ආදාහන කටයුතු ඉතා චාම්ව සිදුකෙරුණි.

ii. <u>සීලයේ ආනිසංස</u>

සීලයේ ආනිසංස 5කි.

* මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම
* කීර්තිය පැතිරීම
* ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකි වීම.
* සිහි මුලා නොවී කළුරිය කිරීම
* මරණින් මතු සුගතියේ උපත ලැබීම
* (මෙම කරුණු ලියා කෙටියෙන් විස්තර කර ඇති පිළිතුරු වලට උපරිම ලකුණු දෙන්න)

iii. <u>ජනක කර්ම</u>

ප්‍රති සන්ධිය ලබා දීමට ඉවහල් වන කර්මය ජනක කර්මයයි. එනම් මිය පරලොව ගොස් ඊළඟ භවයක උපත ලබා දීමට ඉවහල් වන කර්මයයි. ජනක කුසල කර්ම සදෙව් ලොව හා සැප ඇති ස්ථාන වල උපත ලැබීමටත් ජනක අකුසල කර්ම සතර අපායේ ඉපදීමටත් හේතු වේ.

iv. <u>මුරගල</u>

විහාර මන්දිරයක හෝ රාජකීය ගොඩනැගිල්ලක දොරටු අලංකාර කරන අර්ධ කවාකාර මුදුන සහිත ගල් පුවරු දෙක මුරගල නමින් හැඳින්වේ. සඳකඩපහණක හෝ පියගැට පෙළක ආරම්භක පිය ගැටය දෙපස මෙම නිර්මාණය දැකිය හැකිය. මුරගල විකාශණයත් සමඟ විවිධ ආකාර වූ කැටයම් දක්නට ලැබුණි.දැනට දක්නට ලැබෙන ඉතාම කලාත්මක මුරගල හමු වී ඇත්තේ අභයගිරියට අයත් රත්නප්‍රාසාදය නම් ගොඩනැගිල්ල සමීපයෙනි.